# ශ්‍රී ලංකා විදේශ සේවා සංගමය

## இலங்கை வெளிநாட்டு சேவையாளர் சங்கம்

## SRI LANKA FOREIGN SERVICE ASSOCIATION

ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1, ශ්‍රී ලංකාව, குடியரசுக் கட்டிடம், கொழும்பு 1, இலங்கை, **Republic Building, Colombo 1, Sri Lanka**


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>**My No** | ඔබේ අංකය<br>உமது இல<br>**Your No** | දිනය<br>திகதி<br>**Date** |

**මාධ්‍ය නිවේදනය**

**විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට කරන දේශපාලන පත්වීම් පිළිබඳව ශ්‍රී ලංකා විදේශ සේවා සංගමය සිය දැඩි කනස්සල්ල පළ කරයි**

වෘත්තිමයභාවයේ, කුසලතා මත පදනම්ව පත්කිරීමේ සහ රාජ්‍ය තාන්ත්‍රික ප්‍රවීණතාවේ පිළිගත් සම්මතයන් නොසලකා හරිමින් විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල ප්‍රධානී (මහකොමසාරිස් හා තානාපති) ධුර රැසකට ශ්‍රී ලංකා විදේශ සේවයෙන් බැහැරව මෑතකදී පත්කිරීම් සිදුකොට ඇති බව ශ්‍රී ලංකා විදේශ සේවා සංගමය දැඩි කනස්සල්ලෙන් යුතුව නිරීක්ෂණය කරයි.

ගෝලීය වේදිකාවේ ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා සිය වෘත්තීය ජීවිතය කැප කළ, අත්දැකීම් බහුල, ඉහළ සුදුසුකම්වලින් යුත් වෘත්තිමය විදේශ සේවා නිලධාරීන් නොසලකා හැර කරන ලද මෙම පත්වීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා සංගමය සිය දැඩි කලකිරීම ප්‍රකාශ කර සිටියි. ශ්‍රී ලංකා විදේශ සේවය යනු රටේ විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමටත්, රටේ ජාතික අභිලාෂයන් ආරක්ෂා කිරීමටත් විශේෂයෙන් පුහුණුව ලැබූ විශේෂිත සේවයකි. දේශපාලන පත්වීම් වෙනුවෙන් එවන් වෘත්තීය රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් නොසලකා හැරීම ආයතනික අවංකභාවය දුර්වල කරන අතර ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික ස්ථාවරත්වය අනතුරේ හෙළයි.

- “ශ්‍රී ලංකා දූත මණ්ඩල ප්‍රධානීන් ලෙස ප්‍රත්‍යක්ෂ වාර්තා සහිත වෘත්තීය රාජ්‍ය තාන්ත්‍රිකයන් පත් කිරීම. වෘත්තීය විශිෂ්ටත්වය, සදාචාරාත්මක හැසිරීමේ ඉහළම ප්‍රමිතීන් සහ කුසලතා පදනම මත සුදුසුකම් ලත් නිලධාරීන් විදේශ සේවය සඳහා පත් කිරීම”

- “විදේශ සේවය නිර්දේශපාලනීකරණය කිරීම සඳහාත් කුසලතාව මත පදනම්ව පත්කිරීම් සිදු කිරීම සඳහාත් වහා ක්‍රියා මාර්ග ගත යුතුය”

යනුවෙන් සඳහන් වන 2024 රජයේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශය මෙකී දේශපාලන පත්කිරීම්වලින් ඍජුවම උල්ලංඝනය වන බැවින් එම පත්කිරීම් සිදු කිරීම සඳහා ගෙන ඇති තීරණය විශේෂයෙන්ම තැති ගන්වනසුලුය.

මෙකී ප්‍රතිඥා දී තිබියදී වුව, දිගින් දිගටම දේශපාලන පත්කිරීම් සිදුකිරීම ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික ප්‍රජාවේ ඒකාග්‍රතාව අනතුරේ හෙළන අතර, දැඩි පුහුණුවක් ලැබුවා වූත්, විස්තෘත ජාත්‍යන්තර අත්දැකීම්වලින් පරිපූර්ණවූත් වෘත්තීය රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් අධෛර්යයට පත් කරයි.

දිගින් දිගටම පත් වූ රජයන් දේශපාලන වරදාන වශයෙන් මහකොමසාරිස් හා තානාපති ධුර මෙන්ම අනෙකුත් රාජ්‍ය තාන්ත්‍රික තනතුරු පිරිනැමීමේ දීර්ඝ සහ අතිශය කනගාටුදායක


| | | |
|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone: 2325372, 2325375 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax: 2333450, 2446091, 2430220 | ඊමේල්<br>மின்அஞ்சல்<br>E-Mail: slfsa2023@gmail.com |

සම්ප්‍රදායක් රටේ පවතියි. දේශපාලන හිතවත්කම්වලට නොව ශ්‍රී ලංකාවේ හිතසුව හා උන්නතිය පිණිස සේවය කරන වඩාත් ශක්තිමත්, වඩාත් ස්වාධීන විදේශ සේවයකට ඉඩ හසර සලසමින් එම කනගාටුදායක සම්ප්‍රදාය අවසන් වනු ඇතැයි ශ්‍රී ලංකා විදේශ සේවා සංගමය අපේක්ෂා කොට තිබිණි. එකී කනගාටුදායක ප්‍රවණතාව අඛණ්ඩවම ක්‍රියාත්මක වීම, ශ්‍රී ලංකා විදේශ සේවයේ පමණක් නොව මුළු රටේම දැඩි කනස්සල්ලට හේතුවකි.

ඉහත කී පත්වීම් පිළිබඳව යළි සලකා බලන ලෙසත්, කුසලතාව මත පදනම් වූ තෝරාගැනීම් කරන ලෙසත්, වෘත්තීමය, ස්වාධීන හා ඵලදායී විදේශ සේවයක් උදෙසා වූ ස්වකීය කැපවීම ඉහළට ඔසවා තබන ලෙසත්, ශ්‍රී ලංකා විදේශ සේවා සංගමය රජයෙන් උදක්ම ඉල්ලා සිටියි.

මෙම කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා අවස්ථාවක් ලබා දෙන ලෙස ශ්‍රී ලංකා විදේශ සේවා සංගමය අතිගරු ජනාධිපතිතුමාගෙන් සහ ගරු විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඉල්ලීම් කොට තිබේ. කෙසේවුවද, විවිධ අවස්ථාවන්හිදී පසුවිපරම් කොට තිබියදී වුව එවැනි අවස්ථාවක් මේ වන තෙක් ලබා දී නොමැත. ශ්‍රී ලංකා විදේශ සේවා සංගමය එම රැස්වීම් ලබාගැනීම සඳහා දිගින් දිගටම ප්‍රයත්න දරයි.

**ශ්‍රී ලංකා විදේශ සේවා සංගමය**
**කොළඹ**
**2025 පෙබරවාරි 07 වැනිදා**